ප්‍රධාන ලේකම් කාර්යාලය - දකුණු පළාත
பிரதான செயலாளர் அலுவலகம் - தென் மாகாணம்
CHIEF SECRETARY'S OFFICE - SOUTHERN PROVINCE

| | | |
|---|---|---|
| මගේ අංකය / எனது இல. / My No. CSS/7/5/6/1 | ඔබේ අංකය / உமது இல. / Your No. | දිනය / திகதி / Date 2015.07.30 |

ප්‍රධාන ලේකම් උපදෙස් ලිපි (මුදල්) 11-2015

දකුණු පළාතේ සියළුම
ප්‍රධාන ගණන් දීමේ නිලධාරීන් හා
ගණන් දීමේ නිලධාරීන් වෙත.

**වැටුප් පිළිබඳ ගැටලු ආයතන අධ්‍යක්ෂ ජනරාල් වෙත ඉදිරිපත් කිරීමේදී අනුගමනය කළ යුතු උපදෙස් මාලාව**

උක්ත කරුණ සම්බන්ධව රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා ප්‍රජාතාන්ත්‍රීය පාලනය පිළිබඳ අමාත්‍යාංශ ලේකම් විසින් නිකුත් කර ඇති 2015.07.20 දිනැති අංක 03/2015 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ ලිපිය සම්බන්ධයෙනි.(එම චක්‍රලේඛ ලිපියේ පිටපතක් මේ සමඟ අමුණා එවමි.)

02. එමඟින් දෙපාර්තමේන්තුගත තනතුරුවලට අදාළ වැටුප් පිළිබඳ ගැටලු ආයතන අධ්‍යක්ෂ ජනරාල් වෙත ඉදිරිපත් කිරීමේදී අනුගමනය කළ යුතු උපදෙස් මාලාවක් ඉදිරිපත් කර ඇත.

03. ඔබ අමාත්‍යාංශය/දෙපාර්තමේන්තුව යටතේ පවතින ආයතන වල තනතුරු වලට අදාළ වැටුප් ගැටලු සම්බන්ධයෙන් එම චක්‍රලේඛ ලිපියේ සඳහන් උපදෙස් අනුව කටයුතු කරන ලෙස කාරුණිකව දන්වා සිටිමි.එසේම එම චක්‍රලේඛ ලිපියේ සඳහන් වැටුප් චක්‍රලේඛ පිළිබඳ තොරතුරු යාවත්කාලීනව පවත්වා ගෙන යාමට කටයුතු කළ යුතුය.

04. තවද වැටුප් පිළිබඳ ගැටලු ආයතන අධ්‍යක්ෂ ජනරාල් වෙත යොමු කළ යුත්තේ ප්‍රධාන ලේකම් මඟින් පමණක් බවද වැඩිදුරටත් දන්වා සිටිමි. මෙම විධිවිධාන හා චක්‍රලේඛ උපදෙස් පිළිබඳව ඔබ අමාත්‍යාංශය/දෙපාර්තමේන්තුව යටතේ ක්‍රියාත්මක සියලු ආයතන දැනුවත් කරන ලෙසද දන්වමි.

ඩබ්ලිව්.කේ.කේ.අතුකෝරල
ප්‍රධාන ලේකම්,
දකුණු පළාත.

පිටපත් :
01. ලේකම්,රාජ්‍ය පරිපාලන.....අමාත්‍යාංශය : දැ.ගැ.ස.
02. සහකාර විගණකාධිපති, දකුණු පළාත : දැ.ගැ.ස.
03. නියෝජ්‍ය ප්‍රධාන ලේකම්(පාලන) : අ.ක.ස.
04. නියෝජ්‍ය ප්‍රධාන ලේකම්(පිරිස් හා පුහුණු) : අ.ක.ස.
05. අභ්‍යන්තර විගණන අධ්‍යක්ෂ, දකුණු පළාත් සභාව : දැ.ගැ.ස.

ප්‍රධාන ලේකම් / பிரதான செயலாளர் / Chief Secretary 091 2232343
කාර්යාලය / காரியாலயம் / Office 091 2234052 091 2226118
ෆැක්ස් / பெக்ஸ் / Fax 091 2246299
විද්‍යුත් තැපෑල / மின்-அஞ்சல் / E-mail chiefsec1@sltnet.lk
වෙබ් අඩවිය / இ தளம்: / Web site www.cs.sp.gov.lk
ප්‍රධාන ලේකම් කාර්යාලය, එස්.එච්.දහනායක මාවත, ගාල්ල. Chief Secretary's Office, S.H. Dahanayaka Mawatha, Galle.
பிரதான செயலாளர் காரியாலயம், எஸ்.எச்.தஹநாயக மாவத்தை, காலி.